දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 16 / 2015
බ/12/13/02/01/02/2016
ගිණුම් අංශය
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2015.06.09

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන් වෙත

සිරකරු සුබ සාධක අරමුදල් ගිණුමේ 2016 වර්ෂය සදහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

ඉහත අරමුදල සම්බන්ධයෙන් සෑම ඉදිරි වර්ෂයක් සදහාම අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර පුනුරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙතින් අනුමත කරවාගත යුතු අතර ඉන්පසු එය මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය. එබැවින්, පහත සටහන් වලට අනුව 2016 මුදල් වර්ෂය සදහා අය වැය ඇස්තමේන්තුව සකස් කර බන්ධනාගාර මූලස්ථානය වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වමි.

02. එකී අයවැය ඇස්තමේන්තුවට 2016 වර්ෂය තුලදී සුබ සාධක අරමුදලට බැර වශයෙන් බලාපොරොත්තු වන ලැබීම්ද, හර වශයෙන් බලාපොරොත්තු වන ගෙවීම්ද ඇතුලත් කල යුතු අතර අරමුදලේ ලැබීම් වශයෙන් වර්ෂය තුල ලැබීම් වල සත්‍ය තත්වයට ආසන්න වන අයුරින් ලැබීම් ඇස්තමේන්තුව පිළියෙල කල යුතුය. 2016 වර්ෂය සදහා ලැබීම් හා ගෙවීම් ඇස්තමේන්තුව (ආකෘතිය - ඒ) මගින් පිළියෙල කල යුතු අතර 2014 ජූලි සිට 2015 වර්ෂයේ ජූනි දක්වා මාස 12 (දොළහක) ලැබීම් හා ගෙවීම්වල සත්‍ය තත්වය (ආකෘතිය - බී) මගින් පිළියෙල කර එවිය යුතුය.

03. තවද, මෙම ඇස්තමේන්තුව සැකසීමේදී පවතින සත්‍ය වියදමට වඩා විචලනය 20% ඉක්මවයි නම්, මුළු විචලනය ඇතුලත් වියදම් සදහා විස්තරාත්මකව වියදම් විස්තර ලබාදිය යුතුය.2014.07.01 වන දින සිට 2015.06.30 අතර කාලය තුල රැස්කළ ආදායමට වඩා 2016 ආදායම් ශීර්ෂ වල ලැබීම් වැඩි වී ඇත්නම් එම ලැබීම් රැස්කරන ආකාරය බන්ධනාගාර අධිකාරී විසින් පෞද්ගලිකව සහතික කර විස්තරාත්මක ලේඛණයන් එකිනෙක ආදායම් ශීර්ෂය සඳහා පැහැදිලිව ඉදිරිපත් කළ යුතුය.ඉහත උපදෙස් අනුව නියමිත අකෘතීන්ට සැකසූ 2016 වර්ෂය සදහා වන අයවැය ඇස්තමේන්තුව 2015 ජූලි 05 දින හෝ ඊට පෙර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත ලැබීමට සැලැස්විය යුතු බව වැඩි දුරටත් දන්වා සිටිමි.

04. යම් උප බන්ධනාගාර ආයතනයක් 2015 ජූලි 05 දිනට පෙර මෙම ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, එම ආයතනයේ වියදම් සමස්ථ ඇස්තමේන්තුවට ඇතුලත් නොකෙරෙනු ඇත. තවද මෙම ගිණුම් පවත්වාගෙන යායුතු ආකාරය පිළිබද 1977.11.16 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක:56/1977 හා1987.03.20 දිනැති සංශෝධිත දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 559 මගින්ද උපදෙස් ලබාදී ඇත.

05. 2016 වාර්ෂික වියදම් ඇස්තමේන්තුව සකස් කිරීමේදී වියදම් ශීර්ෂ අංක: 01 සිට 06 දක්වා සදහන් කරනු ලබන ඇස්තමේන්තුගත වියදම්, 2016 වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංයුක්ත සැලසුම් හා ක්‍රියාකාර සැලසුම් වලට අනුකූල විය යුතුය. 2016 ඇස්තමේන්තුවට ඇතුලත් වියදම් හැර අන් කිසිවක් සදහා ප්‍රතිපාදන හෝ අක් මුදල් නිකුත් කරනු නොලැබේ.

.........................................
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එම්.බී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

පිටපත: 01. බන්ධනාගාර කොමසාරිස් (අභ්‍යන්තර විගණන)
02. බන්ධනාගාර කොමසාරිස් (සුභසාධක)

(ආකෘතිය - ඒ)

# 2016 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුව

## සිරකරු සුබ සාධක අරමුදල

| 2016 මුදල් වර්ෂය තුල අපේක්ෂිත ලැබීම් (ගිණුමට බැර) | | 2016 මුදල් වර්ෂය තුල අපේක්ෂිත ගෙවීම් (ගිණුමට හර) | |
|---|---|---|---|
| ලැබීම් ශීර්ෂය | රු. | ගෙවීම් ශීර්ෂය | රු. |
| 1. විනෝද භාණ්ඩ නිෂ්පාදන ලාභයෙන් 1/6 කොටස | | 1. සිරකරුවන්ගේ අධ්‍යාත්මික හා ආගමික ශුභ සිද්ධිය සදහාවූ වියදම්. | |
| 2. සිර වේතන වලින් කරනු ලබන අනිවාර්යය අයකිරීම් | | 2. සිරකරුවන්ගේ අධ්‍යපනික ශුභ සිද්ධිය සදහා වූ වියදම්. | |
| 3. මහජන පරිත්‍යාග වලින් ලද මුදල් | | 3. සිරකරුවන්ගේ විනෝද ක්‍රීඩා පහසුකම් හා වෙනත් පහසුකම් සදහා වූ වියදම්. | |
| 4. සිරකරුවන්ගේ ශ්‍රමය සැපයීමෙන් වෙනත් දෙපාර්තමේන්තු වලින් ලද ආදායම්. | | 4. සිරකරුවන්ට ත්‍යාග ලබාදීම සදහා වූ වියදම්. | |
| 5. සිරකරුවන් වෙත තිබී හසුවූ නිති විරෝධී මුදල් ලැබීම් | | 5. පියවිය යුතු අත්තිකාරම් මුදල් (ගෙවීම්) | |
| 6. බන්ධනාගාර හැමියේ තිබී සොයාගත් අයිතිකරුවන් නොමැති මුදල් ලැබීම් | | 6. නිදහස්වූ සිරකරුවන්ගේ පුනුරුත්ථාපනයෙහිලා උපකාර වන පශ්චාත් භාර සේවා වියදම්. | |
| 7. වෙළඳසැල් වලින් ලද මුදල් | | | |
| 8. ප්‍රදර්ශණ වලින් ලද මුදල් | | | |
| 9. ආපන ශාලා වලින් ලද මුදල් | | | |
| 10. විෂය භාර ලේකම් විසින් අනුමත කල වෙනත් දායක මුදල් | | | |
| 11. හිමිකම් පානු නොලැබූ මුදල් | | | |
| 12. පියවිය යුතු අත්තිකාරම් මුදල් (ලැබීම්) | | | |
| වර්ෂය තුල අපේක්ෂිත මුළු ලැබීම් | | වර්ෂය තුල අපේක්ෂිත මුළු ගෙවීම් | |

සකස් කළේ :- ........................................

පරීක්ෂා කළේ :- ........................................

..................................................................

ස. බන්ධනාගාර අධිකාරී/ බන්ධනාගාර අධිකාරී

(ආකෘතිය - බී)

# සත්‍ය ලැබීම් හා ගෙවීම්

(2014.07.01- 2015.06.30)

## සිරකරු සුබ සාධක අරමුදල

| 2014/2015 මුදල් වර්ෂය තුල සත්‍ය ලැබීම් (ගිණුමට බැර) | | |
|---|---|---|
| ලැබීම් ශීර්ෂය | 2014.07.01 සිට 2014.12.31 | 2015.01.01 සිට 2015.06.30 |
| 1. විනෝද භාණ්ඩ නිෂ්පාදන ලාභයෙන් 1/6 කොටස | | |
| 2. සිර වේතන වලින් කරනු ලබන අනිවාර්යය අයකිරීම් | | |
| 3. මහජන පරිත්‍යාග වලින් ලද මුදල් | | |
| 4. සිරකරුවන්ගේ ශ්‍රමය සැපයීමෙන් වෙනත් දෙපාර්තමේන්තු වලින් ලද ආදායම්. | | |
| 5. සිරකරුවන් වෙත තිබී හසුවූ නීති විරෝධී මුදල් ලැබීම් | | |
| 6. බන්ධනාගාර භැම්යේ තිබී සොයාගත් අයිතිකරුවන් නොමැති මුදල් ලැබීම් | | |
| 7. වෙලඳසැල් වලින් ලද මුදල් | | |
| 8. ප්‍රදර්ශණ වලින් ලද මුදල් | | |
| 9. ආපන ශාලා වලින් ලද මුදල් | | |
| 10. විෂය භාර ලේකම් විසින් අනුමත කල වෙනත් දායක මුදල් | | |
| 11. හිමිකම් පානු නොලැබූ මුදල් | | |
| 12. පියවිය යුතු අත්තිකාරම් මුදල් (ලැබීම්) | | |
| **වර්ෂය තුල මුළු සත්‍ය ලැබීම්** | | |

| 2014/2015 මුදල් වර්ෂය තුල සත්‍ය ගෙවීම් (ගිණුමට හර) | | |
|---|---|---|
| ගෙවීම් ශීර්ෂය | 2014.07.01 සිට 2014.12.31 | 2015.01.01 සිට 2015.06.30 |
| 1. සිරකරුවන්ගේ අධ්‍යාත්මික හා ආගමික ශුභ සිද්ධිය සඳහාවූ වියදම්. | | |
| 2. සිරකරුවන්ගේ අධ්‍යාපනික ශුභ සිද්ධිය සඳහා වූ වියදම්. | | |
| 3. සිරකරුවන්ගේ විනෝද ක්‍රීඩා පහසුකම් හා වෙනත් සැප පහසුකම් සඳහා වූ වියදම්. | | |
| 4. සිරකරුවන්ට ත්‍යාග ලබාදීම සඳහා වූ වියදම්. | | |
| 5. පියවිය යුතු අත්තිකාරම් මුදල් (ගෙවීම්) | | |
| 6. නිදහස්වූ සිරකරුවන්ගේ පුණරුත්ථාපනයෙහිලා උපකාර වන පශ්චාත් භාර සේවා වියදම්. | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| **වර්ෂය තුල මුළු සත්‍ය ගෙවීම්** | | |

සකස් කලේ :- ......................................

පරීක්ෂා කලේ :- ......................................

............................................................

ස. බන්ධනාගාර අධිකාර්/ බන්ධනාගාර අධිකාර්